සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

## බුද්ධ ධර්මය

8 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු පළමු ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බුදුරජාණන් වහන්සේ විසින් දෙව් ලොවට කැඳවාගෙන ගොස්, දෙවඟනක් පෙන්වා සිත වෙනස් කොට නිවන් මගට යොමුකරවනු ලැබූ තෙරුන් වහන්සේ වූයේ,

(1) ආනන්ද තෙරුන් ය. (2) නන්ද තෙරුන් ය.

(3) චුල්ල පන්ථක තෙරුන් ය. (4) මහා පන්ථක තෙරුන් ය.

02 බුදුරජාණන් වහන්සේ මහජන මතයට ගරු කළ ශාස්තෘවරයෙක් බව පෙන්වන අවස්ථාවකට උදාහරණයක් වන්නේ,

(1) රජගහනුවර සිටුතුමාගේ ඉල්ලීම පරිදි භික්ෂූන් වහන්සේලාට විහාර වර්ග පහක් අනුමත කළ අවස්ථාවයි.

(2) අෂ්ට ගරුධර්ම පනවා කාන්තා පැවිද්ද ඇතිකළ අවස්ථාවයි.

(3) කුඹල්හලේ දි පුක්කුසාති හමුවූ අවස්ථාවයි.

(4) සුභද්‍ර පිරිවැජියාට ධර්ම දේශනා කළ අවස්ථාවයි.

03 බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම රත්නය සන්දිට්ඨික යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) මනාව අවබෝධ කරගෙන දේශනා කර ඇති බැවින් ය.

(2) ධර්මය මනාව ප්‍රගුණ කරන්නාට ඒ මොහොතේදීම විපාක ලැබෙන බැවින් ය.

(3) තමාට මෙලොවදීම දැන දැකගත හැකි බැවින් ය.

(4) තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙක තබා සිතට නගාගතයුතු බැවින් ය.

04 බුදුරජාණන් වහන්සේ සියලු දෙව් මිනිසුන්ගේ ශාස්තෘවරයා වන බැවින්,

(1) බුද්ධ නම් වන සේක. (2) අනුත්තර පුරිසධම්මසාරථී නම් වන සේක.

(3) ලෝකවිදූ නම් වන සේක. (4) සත්ථා දේවමනුස්සානං නම් වන සේක.

05 නන්දෝපනන්ද නම් නාගරාජයා දමනය කරනු ලැබුයේ කවුරුන් විසින් ද?

(1) බුදුරජාණන් වහන්සේ විසින් ය. (2) මුගලන් මහ රහතන් වහන්සේ විසින් ය.

(3) සැරියුත් මහ රහතන් වහන්සේ විසින් ය. (4) රාහුල මහ රහතන් වහන්සේ විසින් ය.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ තිබෙන වරහන තුළ යොදන්න.**

06 කරන කියන හැම දෙයක් ගැන ම විමසිලිමත් වීම අගසවු චරිත දෙකෙන් අපට ගත හැකි එක් ආදර්ශයකි. ( )

07 යම් කෙනෙක් මුලදී පමාවී සිට පසුව නොපමාව කටයුතු කරයි නම් හෙතෙම දියුණුවට පත්වේ. ( )

08 අපි ඇඳුම් ඇඳිය යුත්තේ මැසි මදුරු උවදුරු වලින් ආරක්ෂාවීම සඳහා පමණි. ( )

09 අන්සතු වස්තුවක් තමාගේ යැයි සිතා වැරදීමකින් ගැනීමෙන් වුවද දෙවැනි සිල් පදයට හානි සිදුවේ. ( )

10 මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය මහා සාවද්‍ය අකුසලයකි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

( වේදේහ රජතුමා / බිම්බිසාර රජතුමා / අනේපිඬු සිටුතුමා / ආයුක්ඛය / උභයක්ඛය)

11 මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥාව පරීක්ෂා කිරීම සඳහා ................................................... බොහෝ අවස්ථාවල නොයෙකුත් ගැටලු ඉදිරිපත් කළේය.

12 සත්වයාගේ ආයුෂ ගෙවීයාම නිසා මරණයට පත්වීම ........................................... මරණ නම් වේ.

13 ................................................... වේළුවනාරාම විහාරය කරවා බුදු සසුනට පූජා කළේය.

14 සැවැත් නුවර ................................................ විසින් දෙවුරම් වෙහෙර කරවන ලදී.

15 අයුෂයද කර්ම ශක්තිය ද යන දෙකම අවසන් වීමෙන් සත්වයා මරණයට පත්වීම ............................................ මරණ නම් වේ.

- **පහත A තීරුවේ දැක්වෙන කාන්තාවන් කවුරුන්දැයි B තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අංකය A තීරුවේ තිබෙන කොටුවෙහි යොදන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16 | සිදුහත් කුමරුගේ මව වූයේ | ☐ | 1. නකුල මාතාව ය. |
| 17 | කාන්තාවන්ට පැවිද්ද ලබාදෙන ලෙස බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේ | ☐ | 2. සාරි බැමිණිය ය. |
| 18 | සැරියුත් තෙරුන්ගේ මව වූයේ | ☐ | 3. මොග්ගල්ලාන බැමිණිය ය. |
| 19 | මුගලන් තෙරුන්ගේ මව වූයේ | ☐ | 4. මහාමායා දේවිය ය. |
| 20 | කිසිදාක සිතින්වත් පර පුරුෂයෙකු නොපැතූ කුලවත් කාන්තාව වූයේ | ☐ | 5. මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ය. |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු ලියන්න.

(i) බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට නිවන් අවබෝධය පහසු කරවනු සඳහා පනවා වදාළ ශික්ෂා පද ඇතුළත් වන්නේ කුමන පිටකයේ ද?

(ii) ගිහියාගේ නිත්‍ය සීලය වන්නේ කුමක් ද?

(iii) දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳ ආකාර තුනෙන් දෙකක් ලියන්න.

(iv) බුදු දහමට අනුව තණ්හාව තුන් ආකාර වේ. ඒවායින් දෙකක් නම් කරන්න.

(v) ''බොරු කීම කැතම ය
ගැරඬි කුණටත් නොසම ය'' යන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(vi) බුදු දහමට අනුව කර්මය දෙයාකාර වේ. ඒවා නම් කරන්න.

(vii) වෙසක් පොහොය වැදගත් වීමට හේතු දෙකක් ලියන්න.

(viii) බුදුරජාණන් වහන්සේගේ අගසව් දෙනම නම් කරන්න.

(ix) කයින් සිදුන අකුසල කර්ම දෙකක් නම් කරන්න.

(x) උම්මග්ග ජාතක කථාවෙන් ප්‍රකට වන බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය කුමක් ද?

(ලකුණු 2 x 10 = 20 යි.)

02 (i) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' යන පාලි පාඨයේ අදහස ලියන්න. (ලකුණු 02 යි.)

(ii) වචනයෙන් සිදුවන අකුසල කර්ම තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) කේලාම් කීම නරක ක්‍රියාවක් වන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

03 (i) ''යස්ස පාපං කතං කම්මං'' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02 යි.)

(ii) එහි අදහස ලියන්න. (ලකුණු 03 යි.)

(iii) කුසල් කිරිමෙන් ඔබට සිදුවන යහපත කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

04 (i) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) පංචස්කන්ධයෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) ඔබගේ මව හෝ පියා අසනීපවී දුකට පත්වී සිටිනවා යැයි සිතන්න. එම අවස්ථාවේදී එතුමියට හෝ එතුමාට ඔබ පිහිට විය යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

05 (i) ගිහි විනය ලෙස හඳුන්වනු ලබන යුතුකම් ඉටුකිරීම පිළිබඳව සඳහන් වන සූත්‍ර දේශනාව කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) එහි සඳහන් වන ස්වාමියා විසින් භාර්යාවට ඉටුකළයුතු යුතුකම් වලින් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) ''ස්වාමියා සහ භාර්යාව අතර ආරවුල් ඇතිවීම දරුවන්ගේ පරිහානියට ඉවහල්වේ.'' මේ බව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

06 (i) සීලය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) අටසිල් පද වලින් පළමු, දෙවන හා තෙවන සිල්පද තුන ලියන්න. (ලකුණු 03 යි.)

(iii) සිල් සමාදන්වීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

07 පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) තණ්හාව

(ii) කර්මය

(iii) නන්ද හාමුදුරුවෝ

(iv) චුල්ලපන්ථක හිමියන් (ලකුණු 5 x 2 = 10 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 1 | (03) | 3 | (04) | 4 | (05) | 2 | (06) | ✓ |
| (07) | ✓ | (08) | × | (09) | × | (10) | ✓ | (11) | වේදේහ රජතුමා | (12) | ආයුක්ඛය |
| (13) | බිම්බිසාර රජතුමා | (14) | අනේපිඬු සිටුතුමා | | | | | (15) | උභයක්ඛය | (16) | 4 |
| (17) | 5 | (18) | 2 | (19) | 3 | (20) | 1 | | | | |

(ල. 20 x 20 = 40)

## II - කොටස

01 (i) විනය පිටකයේ

(ii) පඤ්චසීලය / පන්සිල්

(iii) දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක) / විපරිනාම දුක්ඛතා (වෙනස්වීම පිළිබඳ දුක) / සංඛාර දුක්ඛතා (සංස්කාර පිළිබඳ දුක)

(iv) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා

(v) ඇත්ත නම් — කදිම ය

මෙලොව රජ සැපතටත් — උතුම ය

(vi) අකුසලකර්ම (පාප කර්ම) / කුසලකර්ම (පුණ්‍ය කර්ම)

(vii) සිදුහත් කුමරුගේ ඉපදීම / බෝසතාණන් වහන්සේගේ බුදුවීම / බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම

(viii) සැරියුත් මහරහතන් වහන්සේ සහ මුගලන් මහරහතන් වහන්සේ

(ix) සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම

(x) ප්‍රඥා ගුණ මහිමය (ලකුණු 2 x 10 = 20 යි.)

02 (i) මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි. (ලකුණු 02 යි.)

(ii) බොරුකීම / කේලාම් කීම / පරුෂ වචන කීම / හිස් වචන කීම (ලකුණු 03 යි.)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

03 (i) යස්ස පාපං කතං කම්මං

කුසලේන පිථීයතී

සෝ ඉමං ලෝකං පභාසේති

අබ්භා මුත්තෝව චන්දිමා (ලකුණු 02 යි.)

(ii) යමෙකු විසින් කරන ලද පාප කර්ම ඔහු විසින් ම කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද ඒ තැනැත්තා වලා ගැබෙන් මිදුණු පුන් සඳ මෙන් මේ ලෝකය බබළවයි. (ලකුණු 03 යි.)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05 යි.)

04 (i) ධම්මචක්කපවත්වන සූත්‍රය / දම්සක් පැවතුම් සූත්‍රය (ලකුණු 02 යි.)

(ii) රූප, වේදනා. සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ (ලකුණු 03 යි.)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

05 (i) සිගාලෝවාද සූත්‍රය (ලකුණු 02 යි.)

(ii) සම්මාන කිරීම / අවමන් නොකිරීම / වෙනත් කාන්තාවන් කරා නොයෑම / වගකීම් පවරා දීම / ඇඳුම් පැළඳුම් ලබාදීම (ලකුණු 03 යි.)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

06 (i) කය සහ වචනය සංවර කර ගැනීම (ලකුණු 02 යි.)

(ii) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි

අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි (ලකුණු 03 යි.)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05 යි.)

07 පෙළ පොතේ 96, 97, 98 / 102, 103, 104, 105 / 07, 08 / 05, 06 පිටු බලන්න. (ලකුණු 5 x 2 = 10 යි.)